# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1997 අංක 13 දරන
# බුද්ධිමය දේපළ නීති සංග්‍රහය (සංශෝධන)
# පනත

---

**[සහතිකය සටහන් කළේ 1997 ජූලි මස 21 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1997 ජූලි මස 25 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 4.50 යි.    තැපැල් ගාස්තුව : රු. 2.50 යි.

# 1997 අංක 13 දරන බුද්ධිමය දේපළ නීති සංග්‍රහය (සංශෝධිත) පනත

[සහතිකය සටහන් කළේ 1997 ජූලි මස 21 වන දින]

එල්. ඩී.–ඕ. 61/95.

## 1979 අංක 52 දරන බුද්ධිමය දේපළ නීති සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත 1997 අංක 13 දරන බුද්ධිමය දේපළ නීති සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට බලපැවැත්වෙන පරිදි (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 52 දරන බුද්ධිමය දේපළ නීති සංග්‍රහය පනතේ යම් විධිවිධානයක හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ දැන්වීමක, අවසර පත්‍රයක, සන්නිවේදනයක, ආකෘති පත්‍රයක හෝ ප්‍රධාන ප්‍රඥප්තිය හෝ වෙනත් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ නිකුත් කරන ලද, සාදන ලද, නියම කරන ලද හෝ බලය දෙන ලද වෙනත් ලේඛනයක– 1979 අංක 52 දරන පනත විෂයයෙහි සිදු කරනු ලබන පොදු සංශෝධනය.

(අ) පේටන්ට් බලපත්‍ර හා වෙළෙඳ ලකුණු ලියාපදිංචි කිරීමේ කාර්යාලය හඟවමින් "පේටන්ට් බලපත්‍ර හා වෙළෙඳ ලකුණු ලියාපදිංචි කිරීමේ කාර්යාලය" සහ "ලියාපදිංචි කිරීමේ කාර්යාලය" යන යෙදුම යෙදෙන කවර හෝ තැනක පිළිවෙළින් "ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය" සහ "කාර්යාලය" යන යෙදුම ආදේශ කරනු ලැබිය යුතු ය :

(ආ) මෙහි වූ උපලේඛනයෙහි I වන තීරයේ දක්වා ඇති යම් පදවි නාමයක් කෙරෙහි සඳහන් කිරීමක් කර ඇති විටක ඒ වෙනුවට, ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූප තීරයේ දක්වා ඇති පදවි නාමය ආදේශ කරනු ලැබිය යුතු ය.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(i) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් : සහ

1—D044948—5,900 (97/05)

(ii) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

"(අ) නීති සංග්‍රහයෙන් විධිවිධාන සලස්වා ඇති පරිදි, කාර්මික සැලසුම්, පේටන්ට් බලපත්‍ර, වෙළෙඳ ලකුණු සහ වෙනත් යම් කාරණයක් ලියාපදිංචි කිරීම පිළිබඳ සහ මේ නීති සංග්‍රහයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම පිණිස පත් කරනු ලබන හෝ ඒවා ක්‍රියාත්මක කිරීමෙහි ලා නිරත වන සියලු ම තැනැත්තන් පිළිබඳ සාමාන්‍ය පාලනය සහ අධීක්ෂණය අමාත්‍යවරයාගේ සාමාන්‍ය විධිවිධානවලට යටත්ව රෙජිස්ට්‍රාර්වරයා වෙත පැවරිය යුතු ය ; තව ද ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"(3) නීති සංග්‍රහය පරිපාලනය කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ වෙනත් නිලධරයන් හා සේවකයන් පත් කරනු ලැබිය යුතු ය. " .

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් "එය කාර්මික සැලසුම්, පේටන්ට් බලපත්‍ර සහ ලකුණු ලියාපදිංචි කිරීම සඳහා" යන වචන වෙනුවට "එය කාර්මික සැලසුම්, පේටන්ට් බලපත්‍ර, ලකුණු සහ නීති සංග්‍රහයෙන් විධිවිධාන සලසා ඇති පරිදි වෙනත් යම් කාරණයක් ලියාපදිංචි කිරීම හා පරිපාලනය කිරීම සඳහා යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් "තවද, කාර්මික සැලසුම්, පේටන්ට් බලපත්‍ර සහ ලකුණු ලියාපදිංචි කිරීම සඳහා ශ්‍රී ලංකාවෙහි" යන වචන වෙනුවට, "තවද, කාර්මික සැලසුම්, පේටන්ට් බලපත්‍ර සහ ලකුණු ලියාපදිංචි කිරීම සඳහා සහ නීති සංග්‍රහයෙන් විධිවිධාන සලසා ඇති වෙනත් යම් කාරණයක් සඳහා ශ්‍රී ලංකාවෙහි" යන වචන ආදේශ කිරීමෙන්.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය ඉවත් කිරීම.

7. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

## උපලේඛනය

| *1 වන තීරය* | *2 වන තීරය* |
|---|---|
| (i) ශ්‍රී ලංකාවෙහි පේටන්ට් බලපත්‍ර සහ වෙළෙඳ ලකුණු පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා | බුද්ධිමය දේපළ පිළිබඳ අධ්‍යක්ෂවරයා |
| (ii) පේටන්ට් බලපත්‍ර සහ වෙළෙඳ ලකුණු පිළිබඳ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරයා | බුද්ධිමය දේපළ පිළිබඳ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා |
| (iii) පේටන්ට් බලපත්‍ර සහ වෙළෙඳ ලකුණු පිළිබඳ සහකාර රෙජිස්ට්‍රාර්වරයා | බුද්ධිමය දේපළ පිළිබඳ සහකාර අධ්‍යක්ෂවරයා |
| (iv) (පේටන්ට් බලපත්‍ර සහ වෙළෙඳ ලකුණු පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා හඳුන්වමින්) රෙජිස්ට්‍රාර්වරයා | අධ්‍යක්ෂවරයා |
| (v) (පේටන්ට් බලපත්‍ර සහ වෙළෙඳ ලකුණු පිළිබඳ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරයා හඳුන්වමින්) නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරයා | නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා |
| (vi) (පේටන්ට් බලපත්‍ර සහ වෙළෙඳ ලකුණු පිළිබඳ සහකාර රෙජිස්ට්‍රාර්වරයා හඳුන්වමින්) සහකාර රෙජිස්ට්‍රාර්වරයා | සහකාර අධ්‍යක්ෂවරයා |

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.